www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

# Royal College - Colombo 07

රාජකීය විද්‍යාලය - කොළඹ 07

## Grade 7 – Second Term Test – July 2019

දෙවන වාර පරීක්ෂණය - 2019 ජුලි - 7 ශ්‍රේණිය

කාලය : පැය 2
Time : 2 hours

## History – I

## ඉතිහාසය – I

Name :- ..................................................... Grade : -................ Index number:-....................

❖ **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

- අංක 01 - 05 දක්වා ප්‍රශ්නවලට අදාළ නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

1. මී තෙල් පොගවන ලද පහන්තිර කුඹුරේ තැනින් තැන පත්තු කිරීමෙන් අතීත ගොවීන් බලාපොරොත්තු වූයේ,

   (i) මැස්සන් මර්ධනය කිරීමය. (ii) ගවයන් පන්නා දැමීමය.

   (iii) කුරුල්ලන්ගෙන් වන හානි වැලැක්වීමය. (iv) ඌරන් පලවා හැරීමය.

2. මාතොට, ගෝකණ්ණ හා ගොඩවාය යන නම් වලින් අතීතයේ දී හැඳින් වූ වරායන් වර්තමානයේ දී හැඳින්වෙන නම් පිළිවෙළින් දැක්වෙන පිළිතුර නම්

   (i) මාතර, ගාල්ල,හම්බන්තොට (ii) මන්නාරම, ත්‍රිකුණාමලය, හම්බන්තොට

   (iii) මාතර, ත්‍රිකුණාමලය, ගාල්ල (iv) මන්නාරම, හම්බන්තොට, ත්‍රිකුණාමලය

3. - ලංකාවට බුදු දහම හඳුන්වා දීම.
   - දාගැබ් ඉදිවීම ආරම්භ වීම.
   - විහාරාරාම තැන්වීම ආරම්භ වීම.

   ඉහත සිදුවීම් සිදු වූයේ,

   (i) දුටුගැමුණු රජුගේ කාලයේ දී ය. (ii) කාවාන්තිස්ස රජුගේ කාලයේ දී ය.

   (iii) වළගම්බා රජුගේ කාලයේ දී ය. (iv) දේවානම්පියතිස්ස රජුගේ කාලයේ දී ය.

4. අනුරාධපුර යුගයේදී මධ්‍ය පාලනයට සම්බන්ධ වූ නිළධාරීන් පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

   (i) යුවරජු, අදෙකවරු, රටලද්දන්, ගම්ලද්දන් (ii) සේනාපති, අදෙකවරු, ඇපා, මාපා

   (iii) යුවරජු, ඇපා, මාපා, ගම්ලද්දන් (iv) සේනාපති, ඇපා, මාපා, රටලද්දන්

5. ක්‍රි. ව.1017 දී දකුණු ඉන්දියානු චෝළ අධිරාජ්‍යයේ සිටි පාලකයා වූ පළමුවන රාජේන්ද්‍ර රජ ලංකාව ආක්‍රමණය කර සිරකරුවෙකු ලෙස ඉන්දියාවට ගෙන ගිය ලාංකික රජතුමා වූයේ

   (i) හතරවන මිහිඳු රජු ය. (ii) පරාක්‍රම පාණ්ඩ්‍ය රජු ය.

   (iii) පළමුවන විජයබාහු රජු ය. (iv) පස්වන මිහිඳු රජු ය.



agaram.lk

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

- අනුරාධපුර යුගයේ දී සෞඛ්‍ය පහසුකම් නගා සිටවීමට කටයුතු කළ රජවරුන් කිහිපදෙනෙකුගේ තොරතුරු පහත දැක්වේ. ඒවා නිවැරදිව ගළපා අදාළ පිළිතුරෙහි ඉංග්‍රීසි අක්ෂරය ඉදිරියෙන් ඇති කොටුව තුළ යොදන්න.

| | | | | |
|---|---|---|---|---|
| 6. | සෑම ගම් දහයකටම වෛද්‍යවරයකු බැගින් පත් කිරීම. | ☐ | (a) | පළමුවන උදය රජු |
| 7. | අන්ධයන් සඳහා ආරෝග්‍යශාලා හා දාන ශාලා පිහිටුවීම. | ☐ | (b) | බුද්ධදාස රජු |
| 8. | පොළොන්නරුවේ හා පදවියේ ආරෝග්‍යශාලා පිහිටුවීම. | ☐ | (c) | දෙවනසේන රජු |
| 9. | වසංගත රෝගීන්ට සාත්තුව පිණිස අනුරාධපුරයේ ආරෝග්‍යශාලා තැනවීම. | ☐ | (d) | පළමුවන උපතිස්ස රජු |
| 10. | මිහින්තලයේ රෝහලක් ඉදිකිරීම | ☐ | (e) | හතරවන කස්සප රජු |

- අංක 11 සිට 15 දක්වා දී ඇති ප්‍රකාශන නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (✗) ලකුණ ද දී ඇති වරහන තුළ යොදන්න.

11. දළදා වහන්සේ හා පාත්‍රධාතුව ලබා ගැනීම සඳහා පළමුවන පරාක්‍රමබාහු රජු සුගලා බිසව සමග සටන් වැදුනි. ( )
12. මහා පරාක්‍රමබාහු රජු විසින් ශ්‍රී පාදස්ථානයට යන මාර්ගය ප්‍රතිසංස්කරණය කර එම ස්ථානයට ගම්බිම් පුජා කරනු ලැබීය. ( )
13. ශ්‍රී ලංකාවේ ඇති පැරණි සිතුවම් සහිත විශාලම ලෙන් විහාරය වන්නේ දඹුලු රජ මහා විහාරයයි. ( )
14. පෘතුගීසීන් විසින් කුඩාවට ගොඩනගා තිබූ ගාලු කොටුව ඉංග්‍රීසීන් විසින් ආරක්ෂක බලකොටුවක් බවට පත් කරන ලදි. ( )
15. කැප්පෙටියා ශාකයේ වසන ලාක්ෂා කෘමියාගේ ශ්‍රාවයකින් ලාක්ෂා කර්මාන්තය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ලබාගනී. ( )

- අංක 16 - 20 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර වරහනින් තෝරා හිස්තැනෙහි ලියන්න.

(ගල් විහාරයේ, අභයගිරියේ, දුඹුටුලු, කලා, තෝපා, බුරුමය, පාකිස්ථානය, ඉන්දියාව, ආලක මන්දාව, ප්‍රමද වනය)

16. පොළොන්නරු කතිකාවත, පොළොන්නරුවේ උත්තරාරාමය හෙවත් ..........................ශිලා ලිපියක ලියා තිබේ.
17. පරාක්‍රම සමුද්‍රය සෑදීම සඳහා ......................... හා ......................... යන වැව් දෙක ඒකාබද්ධ කරනු ලැබීය.
18. පළමුවන විජයබාහු රජු චෝළයන් සමග සටනට අවශ්‍ය විදේශ ආධාර ලබා ගැනීමට ....................... සමඟ මිත්‍ර සබඳතා ගොඩනගා ගත්තේය.
19. අතුරුදහන්ව පැවති පැරණි නගරයක් වූ මොහොන්ජොදාරෝ නගරය පිහිටා ඇත්තේ ....................... යේය.
20. පරණවිතාන මහතා විසින් සීගිරි උද්‍යානය ..........................ලෙස නම් කළේය.

(ලකුණු $20 \times 2 = 40$)





agaram.lk

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

සියලුම හිමිකම් ඇවිරිනි / All Rights Reserved

## II කොටස

- **පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5ට පමණක් පිළිතුරු සපයන්න.**

01. (A)



(i) මෙම රූපයෙහි දැක්වෙන සෙල්ලිපිය කුමක්ද?


(ii) මෙම සෙල්ලිපිය කරවූයේ කවුරුන් විසින්ද?

(iii) මෙම ලිපියෙහි ඇතුළත් වූයේ කුමන තොරතුරුද?

(iv) මෙහි සඳහන් පඤ්චිකා පොත භාවිත කළේ කුමන කටයුත්තක් සඳහා ද?

(ලකුණු 1 × 4 = 4)

(B)



(i) මෙම රූපයෙන් දැක්වෙන සන්නස කුමක්ද?

(ii) මෙය හමුවූ පළාත නම් කරන්න.

(iii) මෙහි විස්තර අඩංගු වන රජු නම් කරන්න.

(iv) මෙහි සඳහන් කුමරුට හා ඔහුගේ දෙමාපියන්ට රැකවරණය සපයන ලද්දේ කවුරුන් විසින්ද?

(ලකුණු 1 × 4 = 4)

(C)



(i) පින්තූරයේ දැක්වෙන පිළිමය පිහිටා ඇති විහාරය නම් කරන්න.


(ii) එය පිහිටි නගරය නම් කරන්න.

(iii) මෙම නිර්මාණය සඳහා යොදාගෙන ඇති අමුද්‍රව්‍ය නම් කරන්න.

(iv) මෙම පිළිමය කරවූ රජු නම් කරන්න.

(ලකුණු 1 × 4 = 4)

(D)



(i) පින්තූරයේ දැක්වෙන නගරය නම් කරන්න.

(ii) මෙම නගරය අයත් වන ශිෂ්ටාචාරය නම් කරන්න.

(iii) මෙය පිහිටා ඇති රට නම් කරන්න.

(iv) මෙය ලෝක උරුමයක් ලෙස නම් කිරීමට හේතු වූ කරුණු එකක් ලියන්න.

(ලකුණු 1 × 4 = 4)

02. (i) අනුරාධපුර යුගයේදී රාජ්‍ය පාලනයට සම්බන්ධ වූ පහත සඳහන් නිලධාරින්ට පැවරුණු කාර්යයන් මොනවාද?

(a) මහාලේඛක

(b) අස අදෙක

(ලකුණු 1 × 2 = 2)





agaram.lk

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

Agaram.LK - Keep your dreams alive!

(ii) හතරවන උදය රජු විසින් යහපත් වෙළඳාමක් ඇති කිරීම සඳහා නීති ඇතුළත් කර ටැම් ලිපියක් පිහිටුවනු ලැබීය. එම ටැම් ලිපිය ඇසුරෙන් පිළිතුරු සපයන්න.

(a) එම ටැම් ලිපිය හඳුන්වන නම ලියන්න.

(b) එම ටැම් ලිපිය හා සම්බන්ධ වෙළඳ පොළෙහි නම ලියන්න.


(c) මෙම ටැම් ලිපිය පිහිටු වීමට හේතු වූ කරුණක් ලියන්න.

(d) මෙම ටැම් ලිපියෙහි සඳහන් වෙළඳ පොළ පාලනයට අදාළ නීතියක් ලියා දක්වන්න.

(ලකුණු 4)

(iii) මධ්‍ය පාලනයේ ඉහළම නිළධාරියා වූයේ රජුය. මොහුට පැවරුණු ප්‍රධාන කාර්ය 3ක් ලියන්න. ඉන් දෙකක් පැහැදිළි කරන්න. (ලකුණු 5)

03. (i) සිතියම ඇසුරින් පිළිතුරු සපයන්න.




(a) A අක්ෂරයෙන් දක්වා ඇති රාජ්‍යයේ අගනුවර කුමක්ද?

(b) B අක්ෂරයෙන් දක්වා ඇති දකුණු ඉන්දියානු රාජ්‍ය කුමක්ද?

(ලකුණු 2)

(ii) චෝළයන් විසින් රුහුණු ප්‍රදේශයේ තමන්ට විරුද්ධව දේශපාලන බලයක් ගොඩනැගීම වැළැක්වීම සඳහා ගත් ක්‍රියාමාර්ග 2ක් ලියන්න. (ලකුණු 4)

(iii) පළමුවන විජයබාහු රජතුමා පොළොන්නරුවේ රජ වීමෙන් පසුව සිදු කළ සේවාවන් 5ක් ලියන්න. (ලකුණු 5)

04. (i) මහා පරාක්‍රමබාහු රජතුමා විසින් ඉදිකළ ආගමික ස්ථාන 2ක් ලියන්න. (ලකුණු 2)

(ii) පහත ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(a) මහා පරාක්‍රමබාහු රජුගේ සුළු පියා කවුද?

(b) මහා පරාක්‍රමබාහු රජු හා දෙවන ගජබා රජු අතර ඇතිවූ ගිවිසුම ඇතුළත් සෙල්ලිපිය කුමක්ද?

(c) ක්‍රි.ව. 1164 දී බුරුමය ආක්‍රමණය කිරීම සඳහා මහා පරාක්‍රමබාහු රජු යැවූ සෙනෙවියා කවුරුන්ද?

(d) මහා පරාක්‍රමබාහු රජු උපන් ස්ථානයේ ඉදිකර ඇති වෙහෙර කුමක්ද? (ලකුණු 4)

(iii) නිශ්ශංකමල්ල රජුට මුහුණ දීමට සිදුවූ අභියෝග 3ක් ලියන්න. එම අභියෝග ජය ගැනීමට රජු කටයුතු කළ ආකාරය පැහැදිළි කරන්න. (ලකුණු 5)





agaram.lk

www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

05. (i) පැරණි අනුරාධපුර නගරය තුළ පිහිටි ලෝක උරුම ලැයිස්තුවට ඇතුළත් වූ ස්ථාන 2ක් නම් කරන්න. (ලකුණු 2)

(ii) යුනෙස්කෝ සංවිධානය විසින් ලෝක සංස්කෘතික උරුමයන් තෝරා ගැනීමේදී සැලකිලිමත් වන කරුණු 4ක් ලියන්න. (ලකුණු 4)

(iii) ශ්‍රී ලංකාවේ පිහිටි සංස්කෘතික උරුම අතරින් සීගිරිය ලෝක උරුමයක් ලෙස නම් කර තිබේ. ඊට බලපෑ හේතු 3ක් ලියන්න. ඉන් එක් හේතුවක් කෙටියෙන් පැහැදිළි කරන්න. (ලකුණු 5)

06. (i) පහත සඳහන් නිර්මාණ පිහිටා ඇති නගර නම් කරන්න.

(a) රන්මසු උයන

(b) නිශ්ශංකලතා මණ්ඩපය (ලකුණු 2)

(ii) (a) අස්පෘශ්‍ය උරුමයක් යනු කුමක්ද? (ලකුණු 2)

(b) අස්පෘශ්‍ය උරුම වශයෙන් යුනෙස්කෝ සංවිධානය විසින් හඳුන්වා දී ඇති අංග 2ක් ලියන්න. (ලකුණු 2)

(iii) ශ්‍රී ලාංකිකයන් වශයෙන් අප අපගේ සංස්කෘතික උරුමයන් රැක ගත යුතු ය. මීට බලපාන හේතු 3ක් ලියන්න. ඉන් එක් හේතුවක් කෙටියෙන් පැහැදිළි කරන්න. (ලකුණු 5)

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!



agaram.lk